# සිංහල
# සාහිත්‍ය රසාස්වාදය

පළමු වාරය

# වැඩිදුර ඉගෙනුම් මොඩියුලය
# සාහිත උල්පත
# 6 ශ්‍රේණිය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම :- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිංහල සාහිත්‍ය රසාස්වාදය - 6 ශ්‍රේණිය
පළමු වාරය

වැඩිදුර ඉගෙනුම් මොඩියුලය

සාහිත උල්පත

ප්‍රථම මුද්‍රණය - 2025

ප්‍රකාශනය :- © ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි.

ISBN 978-624-5729-50-0

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
බක්මීගහවැව පාර, පෝරේ, අතුරුගිරිය, 164/4 දරන ස්ථානයේ
පිහිටි ප්‍රින්ට්එක්සෙල් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවන ලදි.

Published by : National Institute of Education
Printed by : PrintXcel (Pvt) Ltd.
164/4, Bakmeegahawewa Road, Pore, Athurugiriya.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් ආධාරක, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් ආධාරක ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
2025.08.11

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී  ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.08

## උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශකත්වය :-**

මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා
සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය :-**

ආචාර්ය පූජ්‍ය කුකුරම්පොල
ඤාණවිමල හිමි
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය :-**

මදාරා ජයරත්න
කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය :-**

නිර්මලී නිරෝෂා ගුණතිලක
කථිකාචාර්ය
හාපිටිගම් ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය

ශ්‍රීමාල් විශ්වජිත් ගුණසේකර
කථිකාචාර්ය
සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

**සංස්කරණය :-**

**අභ්‍යන්තර :-** රුවනි සිසිජා
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ආචාර්ය, රාජකීය පණ්ඩිත
පූජ්‍ය වාවින්නේ
පඤ්ඤානන්ද හිමි
කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

මදාරා ජයරත්න
කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

**භාෂා සංස්කරණය :-**

ආචාර්ය පූජ්‍ය මොරකන්දේගොඩ
අරියවංස හිමි
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
සිංහල අධ්‍යයන අංශය
රුහුණ විශ්වවිද්‍යාලය

**චිත්‍ර :-**

සමන් කලුබෝවිල
කථිකාචාර්ය
හාපිටිගම් ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය

**විවිධ සහාය :-**

ඩී. එම්. ඉරේෂා රංගනා
ජාතික අධ්‍යාපන ආයතනය

ආර්. එල්. ඩී. කේ. දයාසේන
ගුරු සේවය
සියලු ශාන්තුවරයන්ගේ විද්‍යාලය
කොළඹ 10

# හැඳින්වීම

සාහිත්‍යය යනු සහිත බව (සහිතස්‍ය භාවං සාහිත්‍යං) යැයි කියනු ලැබේ. එනම් රසයන්ගෙන් සහිත වීමයි. දැනුමෙන්, අවබෝධයෙන් හා යෝග්‍ය ආකල්පයෙන් පිරිපුන් වනු පිණිස මනස සුසර කරනුයේ සාහිත්‍යයයි. කලා රස වින්දනයෙන් අනූන සංවේදී හා සහකම්පනයෙන් පිරිපුන් මානවකයකු ලෙස ගොඩනැගීම සඳහා සාහිත්‍යයෙන් අප ජීවිත වෙත විහිදුවන ආලෝකය ප්‍රභාෂ්වර ය.

2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සිංහල සාහිත්‍ය රසාස්වාදය වැඩිදුර ඉගෙනුම් මොඩියුල මාලාව 6 ශ්‍රේණියේ සිට ම හඳුන්වා දෙනුයේ සාහිත්‍ය රසාස්වාදය සඳහා ශිෂ්‍යයාට පුළුල් අවකාශයක් සලසා දීම සඳහා ය. කනිෂ්ඨ ද්විතීයික සහ ජ්‍යේෂ්ඨ ද්විතීයික ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සාහිත්‍ය රසඥතාව වර්ධනය කිරීම සඳහා සම්පාදනය කර ඇති මෙම මොඩියුල, නව ඉගෙනුම් ක්‍රමවේද භාවිතයෙන් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සාහිත්‍ය රසඥතා සංවර්ධනය කිරීමටත් නිර්මාණශීලී සහ ඵලදායි ඉගෙනුම් පරිසරයක සුතථ්‍ය ඉගෙනුම් අවස්ථා නිර්මාණය කිරීමටත් ඉවහල් වනු ඇත. 21 සියවසට ගැළපෙන කුසලතාවෙන් පිරිපුන් යහපත් පුරවැසියකු බිහි කිරීම සාහිත්‍ය රසාස්වාදය විෂයමාලාවේ පරිසමාප්ත අරමුණ යි.

සිංහල සාහිත්‍ය රසාස්වාදය වැඩිදුර ඉගෙනුම් මොඩියුල මාලාවේ 6 ශ්‍රේණිය පළමු වාරය සඳහා සම්පාදනය කරන ලද 'සාහිත උල්පත' මොඩියුලය ඔබ අතට පත් කරනුයේ ඉමහත් සතුටිනි. මෙම 'සාහිත උල්පත' වැඩිදුර ඉගෙනුම් මොඩියුලය කවි, ගීත හා කතන්දරවල පසුබිම් තොරතුරු හඳුනා ගැනීමටත් එම නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවා රස විඳීමටත් සාහිත්‍ය නිර්මාණ රස වින්දනයෙන් ලත් පරිචය ඉවහල් කර ගෙන කවි, ගීත හා කතන්දර නිර්මාණය කිරීමටත් ශිෂ්‍යයාට අවකාශ සලසා දීම අරමුණු කර ගෙන සකස් කර ඇත. මෙම මොඩියුලය ඔබගේ ජීවිතයේ සාහිත්‍ය මහෝසය පෝෂණය කරන උල්පතක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන


| | | | |
|---|---|---|---|
| 1. | ගී රස විඳිමු | 01 - | 08 |
| 2. | කවි රස විඳිමු | 09 - | 13 |
| 3. | රස කවි පද බඳිමු-මිහිරි ම ගී ලියමු | 14 - | 18 |
| 4. | කතන්දර රස විඳිමු | 19 - | 24 |
| 5. | ළමා කතා නිර්මාණය කරමු | 25 - | 28 |

ඉගෙනුම් අවස්ථාව 01



කාලච්ඡේද 04යි.

# ගී රස විඳිමු

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- ★ නිර්මාණවල පසුබිම් තොරතුරු හඳුනා ගැනීමටත්
- ★ ගී රස වින්දනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- ★ ගීතවල අර්ථ අවබෝධ කර ගෙන රස විඳීමටත්
- ★ ගීතවලින් ලබා ගත හැකි ජීවිතාදර්ශ හඳුනා ගැනීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

**පෙර මතකය අවදි කරමු**

1. ඔබ රස විඳ ඇති ගීත නිර්මාණයක් මතකයට නගා ගන්න.
2. එම ගීතය රචනා කළේ කවුද?
3. එම ගීතය අසා/කියවා ඔබ ලබා ගත් ආදර්ශ මොනවා ද?
4. එම ගීතය රසවත් වීමට හේතු වූ කරුණු මොනවා ද?

**අපි ගීත රස විඳිමු**

ගීතය රස විඳීමේ දී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

- ගීතයේ මූලික අදහස
- පද ගැළපීම
- තාලය/රිද්මය
- ගීතයෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ

## පිච්ච කැකුළු ගීතය රස විඳිමු



පිරිමි ළමයා :- පිච්ච කැකුළු මල් මාලය කොණ්ඩෙ පලන්දා සුවඳට
වැල්ල දිගේ කෝවිල් ගිය තංගමනී නංගියේ
අම්ම අප්ප කොයි ගිහින්ද ඇයි තනියම පන්සලේ
අර සුවඳ හමන පිච්ච කැකුළු කෝ අද උඹෙ කොණ්ඩයේ...

ගැහැනු ළමයා :- අම්ම අප්ප ගියා උදෙන් වැඩට මාළු වාඩියේ
මහ මූද ඇවිත් දෝරෙ ගියා වාඩියවත් නෑ එහේ
වෙච්ච කරච්චල් කියන්ඩ සාමිත් නෑ කෝවිලේ
ලොකු හාමුදුරුවො අපට ඇවිත් ඉන්න කීවා පන්සලේ

පිරිමි ළමයා :- කැඩිච්ච කෝවිල හදන්න ටික දවසක් යයි නගේ
අපි බුදු සාදුට වැඳල අහමු අම්ම අප්පා ගැන නුඹේ

ගැහැනු ළමයා :- මෙච්චරකල් කවදාවත් පන්සලකට නෑ ගියේ
අපි හැමදාමත් දුක කීවේ දෙවියන්ටයි කෝවිලේ

පිරිමි ළමයා :- දෙවියො බුදුන් කාටත් දුක තේරෙනවා එක වගේ
අපි බුදු සාදුට වැඳල පස්සෙ කෝවිලටත් යමු නගේ

ගැහැනු ළමයා :- එහෙනම් මට කියාදෙන්න වඳින විදිහ පන්සලේ
බුදු සාදුට පූජා කරන්න පිච්ච මලක් නෑ අතේ

පිරිමි ළමයා :- අත් පොඩි දෙක එකට තියල වඳින ලෙස ම කෝවිලේ
සුදු අරලිය මල් පූජ කරමු ඒවත් සුවඳයි නගේ //



ගායනය - හර්ෂණ දිසානායක
කස්තුරි සූරියකුමාර්
සංගීතය - රෝහණ වීරසිංහ
පද රචනය - සෝමතිලක දිසානායක

අන්තර්ජාලයට පිවිස ගීතයට සවන් දෙන්න.

ගීතයෙන් කියැවෙන අදහස ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.

## කතුවරයා හඳුනා ගනිමු

**සෝමතිලක දිසානායක**



උපත - 1956 අප්‍රේල් 27

ගම - දඹදෙණිය

පාසල - මයූරපාද මධ්‍ය මහා විද්‍යාලය

වෘත්තිය - 1977 ජුනි 1 දින ශ්‍රී ලංකා නාවික හමුදා සේවයට එක් වී ඇත.
2011 ජනවාරි 15 දින සිට ශ්‍රී ලංකාවේ 17 වැනි නාවුක හමුදාපති වශයෙන් කටයුතු කර ඇත.

කතුවරයාගේ වෙනත් ගීත නිර්මාණ

- ★ පාන්දරින් ඉස්කෝලෙට
- ★ පොඩි හාමුදුරුවෝ
- ★ අත්තම්මා නිවන් ගිහින්
- ★ ඇත් රජුනේ

සවන් දුන් ගීතය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

### ක්‍රියාකාරකම 1.1

1. මෙම ගීතය රචනා කළේ කවුද?
2. එම රචකයාගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරන්න.

## ක්‍රියාකාරකම 1.2

1. 'පිච්ච කැකුළු' ගීතයෙන් කියවෙන්නේ කුමක් ගැන ද?
2. මෙම යෙදුම්වල අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.
   - i. අම්ම අප්ප ගියා උදෙන් වැඩට මාළු වාඩියේ
   - ii. මහ මූද ඇවිත් දෝරෙ ගියා වාඩියවත් නෑ එහේ
   - iii. වෙච්ච කරච්චල් කියන්ඩ සාමිත් නෑ කෝවිලේ
   - iv. දෙවියො බුදුන් කාටත් දුක තේරෙනවා එක වගේ

## ක්‍රියාකාරකම 1.3

1. මෙම ගීතයේ සඳහන් චරිත හතරක් නම් කරන්න.
2. තංගමනී කොණ්ඩයේ පැළඳ සිටියේ කුමක් ද?
3. තංගමනී දැන් නැවතී සිටින්නේ කොහේ ද?

## ක්‍රියාකාරකම 1.4

- ⋆ පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.
- ⋆ ගීත නිර්මාණය රසවත් වීමට හේතු වූ කරුණු සහ ගීතයෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- ⋆ ඔබ සාකච්ඡා කළ කරුණු නිර්මාණශීලී ලෙස පන්තියට ඉදිරිපත් කරන්න.
- ⋆ අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කරන අදහස්වලට සවන් දෙන්න.


## ක්‍රියාකාරකම 1.5

- ⋆ මෙම ගීතය රසවත් වීමට හේතු දෙකක් ලියන්න.

**ඔබේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.**

**ඔබගේ හැකියාවට අනුව අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න.**

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| මෙම ගීතය නිර්මාණය කළ කතුවරයා සහ ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් කියන්න මට පුළුවන් | | | |
| මෙම ගීතය කියවා අවබෝධ කර ගත් කරුණු ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න මට පුළුවන් | | | |
| ගීතය රසවත් වීමට හේතු සහ ලබා ගත හැකි ජීවිතාදර්ශ කියන්න මට පුළුවන් | | | |



## මිදුලේ වැලි මාලිගාවෙ ගීතය රස විඳිමු

මිදුලේ වැලි මාලිගාවෙ
සක්විති පදවිය ලබන්න
ගල් වැට ළඟ වාඩිවෙලා
සඳ පායන හැටි බලන්න
සතර දිසා ජය ගෙන මම හනික එමි
ඔබේ ලොවට සඳ හිරු වී එළිය දෙමි

පීනා සිප් සයුර දෙතෙර
සියල් සතර දැන පිරිසිඳ
ලොවේ අනේක අවමන් මැද නො සෙල්වෙමි
මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමි

මිදුලේ වැලි මාලිගාවෙ
සක්විති පදවිය ලබන්න//

එපා ඔටුනු මගේ සිරසට
එපා සිහසුනක් හිඳිනට
සිනා සිසී මා එන මඟ හිඳිනු මැනේ
දුවේ කියා මා අමතන් පියාණනේ

මිදුලේ වැලි මාලිගාවෙ
සක්විති පදවිය ලබන්න//



ගායනය - ජේෂලා මෙන්ඩිස්
සංගීතය - රෝහණ වීරසිංහ
පද රචනය- කුමාරදාස සපුතන්ත්‍රි

අන්තර්ජාලයට පිවිස ගීතයට සවන් දෙන්න.

ගීතයෙන් කියවෙන අදහස ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.

★ කවි/ගීත රසවත් කරන විශේෂ යෙදුම් හඳුනා ගනිමු.

| උපමා | රූපක |
|---|---|
| අම්මා සඳක් වැනි ය | අම්මා සඳකි |
| ඔබේ මුහුණ මලක් වැනි ය | ඔබේ මුහුණ මලකි |
| සාගරයක් වැනි ශිල්පය | සිප්සයුර/ශිල්පසාගරය |

| | |
|---|---|
| **උපමාවේ දී** | වැනි, මෙන්, සේ යන නිපාත යොදා ගෙන එක් දෙයක් තවත් දෙයකට සමාන කරනවා.<br>උදා - අම්මා සඳක් වැනි ය |
| **රූපකයේ දී** | වැනි, මෙන්, සේ යන නිපාත ඉවත් කරලා සමාන කරන වස්තු දෙක එකක් ලෙස ඉදිරිපත් කරනවා.<br>උදා - අම්මා සඳකි |

## කතුවරයා හඳුනා ගනිමු

**කුමාරදාස සපුතන්ත්‍රි**



උපන් ගම - මාතර දිස්ත්‍රික්කයේ පාලටුව
පාසල - බේරුවල වලතර මහා විද්‍යාලය
රචනා කළ ගීත - අකුරු මැකී නෑ, සොයා පිළිසරණක්,
පිතු සෙනෙහේ පිදූ, මිනිසා සුවඳයි මල සේ,
ඉස්සර මං ගිය පාසල ඇරිලා

### ක්‍රියාකාරකම 1.6

1. ඔබ සවන් දුන් ගීතය රචනා කළේ කවුද?
2. එම රචකයාගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරන්න.

ඔබ රස විඳි ගීතය ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

### ක්‍රියාකාරකම 1.7

1. මේ ගීතයෙන් කියවෙන්නේ කුමක් ගැන ද?
2. මේ ගී පදවල අදහස ඔබේ වචනයෙන් ලියන්න.
   i. පීනා සිප් සයුර දෙතෙර
   ii. සියල් සතර දැන පිරිසිඳ
   iii. ලොවේ අනෙක අවමන් මැද නො සෙල්වෙමි
   iv. මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමි

## ක්‍රියාකාරකම 1.8

පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු දෙන්න.

1. මෙම ගීතයේ සඳහන් වන චරිත දෙකක් නම් කරන්න.
2. සක්විති පදවිය ලබන්නේ කොහේ ද?
3. සඳ හිරු වී එළිය දෙන්නේ කාගේ ලොවට ද?

## ක්‍රියාකාරකම 1.9

- ★ පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.
- ★ ගීත නිර්මාණය රසවත් වීමට හේතු වූ කරුණු සහ ගීතයෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- ★ ඔබ සාකච්ඡා කළ කරුණු නිර්මාණශීලී ලෙස පන්තියට ඉදිරිපත් කරන්න.
- ★ අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කරන අදහස්වලට සවන් දෙන්න.

## ක්‍රියාකාරකම 1.10

1. ගීතය රසවත් වීමට හේතු දෙකක් ලියන්න.
2. මෙම ගීතයේ ඇතුළත් රූපකයක් සොයා ලියන්න.

ඔබේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.
ඔබගේ හැකියාවට අනුව අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න.

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| ගීතය නිර්මාණය කළ කතුවරයා සහ ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් කියන්න මට පුළුවන් | | | |
| ගීතය කියවා අවබෝධ කර ගත් කරුණු ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න මට පුළුවන් | | | |
| ගීතය රසවත් වීමට හේතු සහ ලබා ගත හැකි ජීවිතාදර්ශ කියන්න මට පුළුවන් | | | |
| ගීතයේ ඇතුළත් රූපකය හඳුනා ගන්න මට පුළුවන් | | | |

ඉගෙනුම් අවස්ථාව **02**



කාලච්ඡේද 02යි.

# කවි රස විඳිමු

**මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;**

- ★ පද්‍ය නිර්මාණයේ පසුබිම් තොරතුරු හඳුනා ගැනීමටත්
- ★ කවි රස වින්දනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- ★ පද්‍ය පන්තියේ අර්ථ අවබෝධ කර ගෙන රස විඳීමටත්
- ★ පද්‍ය පන්තියෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ හඳුනා ගැනීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

**පෙර මතකය අවදි කරමු**

වෙසක් කැකුළු අතු අග ඉඳ නටන විලාසේ
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ
පියලි සලාලා රේණු හලාලා
සුවඳ උරා සිසිල් සුළං හමන්නේ
ලොව මැ අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ



1. ඉහත ගීත කොටසේ සඳහන් සොබා දහමේ සුන්දර වස්තූන් මොනවා ද?
2. ගීතයේ කියවෙන ආකාරයට ලෝකය අමුතු පණක් ලබන්නේ කෙසේ ද?
3. පරිසරයේ සුන්දර බව ගැන කියවෙන වෙනත් කවි/ගීත ඔබ අසා තිබේ ද?

කවි/ගීත රස වින්දනයේ දී සැලකිලිමත් විය යුතු තේමාව, පද ගැළපීම, තාලය, එළිසමය, උපමා භාවිතය, භාෂාව යොදා ගන්නා ආකාරය ආදි කරුණු ගැන අවධානය යොමු කරමින් පහත කවි පන්තිය රස විඳිමු.



# මල් බස්

ගස අග      නා
අර      රඳනා
මලට      මනා
බොහො ම      හිනා

දැනුත්      නිඳන
වැලට      සුමන
එ සිනා      සෙන
සැටි ය      සිතෙන

සුපිපුණ      බුත්
සරණ      පෙළෙත්
දේදුන්නෙ      ත්
කිය      වෙනසැත්

ගස      වතුසුදු
වී      පිරිසුදු
පොහොය නැත      දු
සිල් ගත්      බඳු

දහස්      දලා
ගස      විමලා
මහණ වැ      ලා
සිටින      තුලා

මල      කිණිහිරි
රුවිනි      සසිරි
නැති නැණ      සිරි
දරුවකු      සරි

නොඑන      පිණිස
ලකුණක්      ලෙස
මේ වද      ගස
පා මල්      රැස





සිනාව සරු
ගුණැති නපුරු
දනන් අයුරු
මෙ මල් කපුරු

නැණ ගුණ දම්
රුව පැහැ තුම්
ඇති අය නම්
රෝස කුසුම්

එ බඳු විසිත්
මලැති පසත්
රෝස ගසෙත්
කටු පෙළ ඇත්

මහ පුදුමෙකි
මලෙක මලෙකි
නැහැ එහි සකි
සමනළයෙ කි

මලක් මෙහෙ ම
කෙඳිරි ගෑම
නෑසිම් මම
කලෙක කිසි ම

ළඟ පා සල
නිසා මෙ මල
මතුරා තොල
උගනී බල

මී මැස්සා
එහි බැස්සා
මල උස්සා
බල ගස්සා



අන්තර්ජාලයට පිවිස කවි පන්තියට සවන් දෙන්න.

පද්‍ය නිර්මාණයෙන් කියවෙන අදහස ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.

## කතුවරයා හඳුනා ගනිමු

කුමාරතුංග මුනිදාස



උපත - 1887 ජූලි 25

විපත - 1944 මාර්තු 02

ඉගෙන ගත් පාසල් - දික්වැල්ල බෞද්ධ පාඨශාලාව සහ මාතර සාන්ත තෝමස් විද්‍යාලය

හෙළ හවුල පිහිටුවා ගැනීම - 1941 දී හෙළ හවුල පිහිටු වී ය.

ළමා සාහිත්‍ය නිර්මාණ කිහිපයක් - ශික්ෂා මාර්ගය, කියවන නුවණ, හත් පණ, මඟුල් කෑම, හීන් සැරය, කුමර ගී

**ක්‍රියාකාරකම 2.1**

පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

1. 'මල් බස්' පද්‍ය නිර්මාණයේ රචකයා කවුද?
2. එම රචකයාගේ වෙනත් ළමා සාහිත්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

කවි පන්තිය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

**ක්‍රියාකාරකම 2.2**

1. මෙම කවි පන්තියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?
2. පහත කවි පදවල අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.
   - i. පොහොය නැත දු - සිල් ගත් බඳු
   - ii. සිනාව සරු - ගුණැති නපුරු
   - iii. එසිනා සෙන - සැටිය සිතෙන
   - iv. මල කිණිහිරි - රුවිනි සසිරි

### ක්‍රියාකාරකම 2.3

1. කවියා සඳහන් කරන ආකාරයට රෝස කුසුමට සමාන වන්නේ කුමන ගති ලක්ෂණ ඇති කෙනෙක් ද?
2. 'මලෙක මලෙකි' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
3. දේදුන්නට සමාන කරන්නේ කුමන මල් වර්ගය ද?

### ක්‍රියාකාරකම 2.4

* පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.
* කවි පෙළේ සඳහන් මල් වර්ග පන්තියට රැගෙන විත් ඒවායේ ලක්ෂණ නිරීක්ෂණය කරන්න.
* පද්‍ය නිර්මාණය රසවත් වීමට හේතු වූ කරුණු සහ ලබා ගත හැකි ජීවිතාදර්ශ කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
* ඔබ සාකච්ඡා කළ කරුණු නිර්මාණශීලී ලෙස පන්තියට ඉදිරිපත් කරන්න.
* අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කරන අදහස්වලට සවන් දෙන්න.

### ක්‍රියාකාරකම 2.5

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

1. කවි පන්තිය රසවත් වීමට හේතු දෙකක් ලියන්න.
2. කවි පන්තියේ දැක්වෙන උපමා හඳුනා ගෙන ඉදිරිපත් කරන්න.
3. කවි පන්තියේ යෙදී ඇති රූපක සොයා ලියන්න.

ඔබේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.
ඔබගේ හැකියාවට අනුව අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න.

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| පද්‍ය නිර්මාණයේ කතුවරයා සහ ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් කියන්න මට පුළුවන්. | | | |
| කවිය කියවා අවබෝධ කර ගෙන අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න මට පුළුවන්. | | | |
| කවිය රසවත් වීමට හේතු සහ ලබා ගත හැකි ජීවිතාදර්ශ කියන්න මට පුළුවන්. | | | |
| කවියේ ඇතුළත් වන උපමා/රූපක හඳුනා ගන්න මට පුළුවන්. | | | |

ඉගෙනුම් අවස්ථාව 03



කාලච්ඡේද 02යි.

# රස කවි පද බඳිමු - මිහිරි ම ගී ලියමු

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- ★ කවි/ගීත නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- ★ කවි/ගීත නිර්මාණය කිරීම සඳහා සුදුසු සිදුවීමක්/අද්දැකීමක්/අවස්ථාවක් හඳුනා ගැනීමටත්
- ★ විවිධ තේමා යොදා ගෙන කවි/ගීත නිර්මාණය කිරීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

## කවි/ගීත ලිවීමට පෙරහුරුවක් ලෙස පහත ක්‍රියාකාරකම්වල නිරත වන්න.

### ක්‍රියාකාරකම 3.1

පහත කවි සම්පූර්ණ කරන්න.

(1) ඉරක් සේ දැල්වෙනා
සඳක් සේ සුවදෙනා
මලක් සේ සුපිපෙනා
.........................................................

2. අහස අපිට ගොඩක් දුරයි
නිල් පාටට හරි ම හැඩයි
ලස්සන පොඩි වලා ගොඩයි
.........................................................

3. ඉරට කලින් නැගිටිනවා
ගේ දොර හැම අමදිනවා
පහන වගේ බැබළෙනවා
.........................................................

### ක්‍රියාකාරකම 3.2

පහත දැක්වෙන කවිවල අවසන් පද සම්පූර්ණ කරන්න.

1. කුරුලු ගීත සවන් පිනයි
සිසිල් සුළඟ පවන් සලයි
..................................................................
..................................................................

2. කළ යුතු වැඩ අද ම කළොත්
කම්මැළි සිත මග හැරියොත්
..................................................................
..................................................................

3. අම්මා පහන නිවසේ අප සැම රකින
නිම්මා නැතේ දුක් ගිනි උහුලා ගන්න
..................................................................
..................................................................

### ක්‍රියාකාරකම 3.3

පහත ගීතය සම්පූර්ණ කරන්න.

1. පුරන් කුඹුරු අස්වැදෙනා කාලයේ
කීචි බීචි රැන් කුරුලු රාව නැගෙන්නේ
කිරි ඉල්ලා වහු පැටවුන් අන්න හඬනවා
..................................................................
..................................................................

2. ඉර ඇහැරෙන හිමිදිරියේ
සා පැටවුනි නටන්න
මල් පිබිදෙන අරුණෝදේ
සකුණ ගීත ඇහෙන්න
හද මල් පෙති තෙමෙන්න
..................................................................
..................................................................

## ක්‍රියාකාරකම 3.4

පහත ලබා දී ඇති ගීත කොටස් සම්පූර්ණ කරන්න.

1. ඉර මාමේ මේ අහන්න
නිල් අහසට පාට ගෑවෙ
කවුරුන් දැයි මට කියන්න
පුංචි බට්ටි කුරුල්ලනේ
ළඟට එන්න ටිකක් අනේ
ඔය වීණා නද දුන්නේ
කවුරුන් දැයි මට කියන්න
...............................................
...............................................
...............................................
...............................................

2. රෑං ගාලා පියාඹන්න උඩ ආකාසේ
රෑං පෙත්තෙ හැඩේ තියෙන තටු මට නෑනේ
හීන් හඬින් ගීත ගයා මල් ගස් මුදුනේ
සුළඟ වගේ කොහෙද යන්නේ
අල්ලනු බෑනේ
...............................................
...............................................
...............................................
...............................................

## අපි තනි ව කවි-ගීත ලියන්න උත්සාහ කරමු.

කවි ලියන්නට පෙර කවි-ගීත නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

- වෙනත් කවි-ගීත සොයා ගෙන කියවන්න/රස විඳින්න.
- සුදුසු සිදුවීමක්/අවස්ථාවක්/අද්දැකීමක් තෝරා ගන්න.
- නිර්මාණයට ගැළපෙන පරිදි භාෂාව යොදා ගන්න.
- තාලය/රිද්මය පිළිබඳ සැලකිලිමත් වන්න.
- සිවුපද කවි/නිසඳැස් කවි, එළිසමය, උපමා, රූපක, අනුප්‍රාසය, රිද්මය යන කරුණු පිළිබඳ ගුරුතුමා/ගුරුතුමියගෙන් අසා දැන ගෙන සරල අවබෝධයක් ලබා ගන්න.
- ඔබේ නිර්මාණය රසවත් කර ගැනීම සඳහා එවැනි කරුණු යොදා ගන්න.

**ක්‍රියාකාරකම 3.5**

පන්තියේ සිසුන් තිදෙනා බැගින් කණ්ඩායම් වන්න.

පහත අදහස්වලින් තෝරා ගත් අදහසකට අනුව කවියක්/ගීතයක් නිර්මාණය කරන්න.

- ඔබ නිර්මාණය කළ කවි පෙළ/ගීතය පන්තිය ඉදිරියේ ශබ්ද නගා කියවන්න/ගායනා කරන්න.
- ඔබේ නිර්මාණය පිළිබඳ පන්තියේ මිතුරු මිතුරියන්ගේ අදහස් විමසන්න.
- එම නිර්මාණය පුවත්පතක/බිත්ති පුවත්පතක පළ කරන්න.

★ මොර සූරන වැස්ස... අහස කළුවෙලා... ගස් අඹරවා ගෙන... විදුලිය කොටනවා... සුළං හමනවා... මගේ හිතෙත් විදුලිය කොටනවා...


★ ජම්බු ගහ රතුපාටට විදුලිය බුබුලු දාලා වගේ... කොළපාට කොළ අස්සෙන් රතුපාට පේන කොට හරි ම ලස්සන යි. සෙල්ලම් පිට්ටනියේ එහාට මෙහාට දුවන අපේ පුංචි යාළුවන්ගේ හිනාවත් රතුපාට ජම්බු ගෙඩි වගේ ම යි. අපි සමගියෙන් ඉන්න කොට ජීවිතේ ගොඩක් ලස්සන යි.

★ චූටි කුරුල්ලන්ගේ කීචි බීචිය... සමනලයන්ගේ රැඟුම්... පරිසරය මඟුල් ගෙයක් වගේ... මේ ලස්සන හැමදා ම පරිස්සම් කර ගන්න ඕනේ.

## ක්‍රියාකාරකම 3.6

- පහත චිත්‍ර නැරඹීමෙන් ඔබේ සිතට නැගෙන අදහස කවියකින්/ගීතයකින් ඉදිරිපත් කරන්න.

(i)



..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................

(ii)



..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................



කාලච්ඡේද 02යි.

# කතන්දර රස විඳිමු

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- ★ ළමා කතන්දරයේ පසුබිම් තොරතුරු හඳුනා ගැනීමටත්
- ★ කතන්දර කියවා අර්ථය අවබෝධ කර ගැනීමටත්
- ★ කතන්දරයේ චරිත, සිද්ධි හා අවස්ථා හඳුනා ගැනීමටත්
- ★ කතන්දරය රසවත් වීමට හේතු වූ කරුණු හඳුනා ගෙන කතන්දරය රස විඳීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

**පෙර මතකය අවදි කරමු**

ඔබ කියවා ඇති ළමා කතන්දරයක් මතකයට නගා ගන්න.

1. එම කතාවේ ඔබගේ සිත් ගත් චරිත දෙකක් කියන්න.
2. එම කතාවේ වඩාත් සිත් ගත් සිද්ධියක් විස්තර කරන්න.

**පහත කතන්දරය ශබ්ද නගා කියවන්න.**

## රතු දිමියා

මී අඹ වාරෙට මී අඹ හැදුණම හැම තැන ම සුවඳ පැතිරෙනවා. පැණි සුවඳට මී මැස්සෝ, සමනලයෝ, කුරුල්ලෝ රංචු පිටින් අඹ ගහ දිහාට ඇදෙනවා. චූටික්කෝ බට්ටිච්චෝ කීචි බීචි කියමින් මී අඹවල රස බලනවා.

ඔන්න ඔය අතරෙදි කෑම සොයා ගිය දිමියෝ රැළකටත් මේ මී අඹ සුවඳ දැනුණා.

“ම්... හොඳ සුවඳක්... මී අඹ ගහක් ළඟ ම ඇති.” දිමියෝ වට පිට බැලුවා.

“ආ! අර තියෙන්නේ මී අඹ ගහ. දුවමු දුවමු.” දිමියෝ රැළ එක පිම්මට මී අඹ ගහ දිහාට දුවලා ගියා. ගහට නැගලා ඇති වෙනකල් පැණි බිව්වා.

“මේ ගහ හොඳයි අපිට ගෙවල් හදා ගන්න. එතකොට කෑම සොයන්න ඈතට යන්න ඕනෙත් නැහැනෙ.” දිමියො කතා වුණා.

“ඔව්... ඔව්... අපට ගෙවල් හදා ගන්න මෙතන හොඳයි.” හැමෝම සිතුවා.

ඉතින් දිමියෝ රංචුව ම එකතු වෙලා ගෙයක් හදන්න පටන් ගත්තා.

මුලින් ම ගහේ හොඳ අත්තක් තෝර ගත්තා. අඹ කොළ දෙක තුනක් එකතු කර ගෙන ගොටුවක් හැදුවා. දිමි තාත්තලා, දිමි අම්මලා, දිමි පැංචො හැමෝම එකා වගේ දිමි ගොටුව හදන්න මහන්සි වුණා.

හැමෝම එකතු වෙලා වැඩ කළ නිසා ටික වෙලාවකින් දිමි ගොටුව ම හදලා ඉවර වුණා. පුංචි දිමි පැංචන්ට ඉන්න පුංචි පුංචි කාමරත් හැදුවා. පුංචි දිමි පැංචන් අලුත් ගේ වටේ දුවමින් සෙල්ලම් කළා.



ඒත් එක දිමියෙක් විතරක් පැත්තකට වෙලා ඉන්නවා.

ඇයි ඒ?

එයා කැමති නෑ මේ වගේ රංචු ගැහිලා ඉන්න. එයාට නිතර ම කේන්ති යනවා. අනිත් අය එක්ක රණ්ඩු කරනවා. කාටවත් උදවු කරන්නෙත් නෑ. කවුරු හරි උදව්වක් ඉල්ලුවොත් "මට බෑ" කියනවා.

"රංචුවක් එක්ක ඉන්න කොට හරි කරදරයි. ඒ නිසා මම තනිව ම ගෙයක් හදා ගෙන ඉන්න ඕනෙ." එයා හිතුවා.

ඉතින් ගහේ හොඳ අත්තක් තෝරලා ගෙයක් හදන්න පටන් ගත්තා. කොළ දෙකක් අරගෙන එකට එකතු කරන්න හැදුවා. ඒත් හිතුව තරම් ලෙහෙසි නෑ වගේ ඒ වැඩේ. එක කොළයක් අල්ලන කොට අනිත් කොළේ ලිස්සනවා.

"ඔයාගේ දිමි ගොටුව හදන්න අපිත් උදවු කරන්න ද?"

රතු දිමියා කොළ දෙකක් අල්ලා ගෙන එහාට මෙහාට දඟලනවා දැකලා අනිත් දිමියෝ ඇහුවා.

"නෑ... නෑ... ඕනේ නෑ මට තනිව ම වැඩ කරගන්න පුළුවන්." රතු දිමියා චණ්ඩියා වගේ කීවා.

ඉතින් අනිත් අය සද්ද නැතුව හිටියා. රතු දිමියා කොළ දෙක එකතු කරන්න මුළු දවස ම මහන්සි වුණා. ඒත් බැරි වුණා.

අනිත් අයගේ දිමි ගොටුව ඉක්මනින් හදලා ඉවර වුණාට රතු දිමියාගේ

ගොටුවට දවස ම මහන්සි වෙලත් හදා ගන්න බැරි වුණා.

"රතු දිමියෝ අපි ඔයාට උදවු කරන්න ද? ඔයාට තනිය ම දිමි ගොටුවක් හදන්න බෑ. දිමි ගොටුවක් හදන්න දිමියො ගොඩක් ඕනෙ වෙනවා. අපි හැමෝම එකතු වෙලා ඔයාට ඉක්මනට වැඩේ ඉවර කරල දෙන්නම්."

රතු දිමියා ගැන දුක හිතුණු අනිත් දිමියෝ කීවා.

"නෑ මට කාගෙවත් උදවු ඕනෙ නෑ. මට තනිව ම ගොටුව හදන්න පුළුවන්"

රතු දිමියා තවත් ආඩම්බරෙන් කීවා.

හවස් වෙනකොට රතු දිමියාට හරි මහන්සියි. උදේ ඉඳන් මහන්සි වුණත් තවමත් කොළ දෙක එකතු කරගන්න බැරි වුණා. රෑ එළි වෙනකල් මහන්සි වුණා. ඒත් බැරි වුණා. පහුවදාත් වැඩ පටන් ගත්තා. අනිත් අය එකතු වෙලා ගෙවල් හදලා කෑම කාලා සමගියෙන් සින්දු කිය කියා ඉන්න කොට රතු දිමියා දහඩිය දාගෙන දිමි ගොටුවක් හදන්න මහන්සි වෙනවා.

එයාලා සින්දු කිය කියා ඉන්න කොට රතු දිමියාට හරි කේන්තියි.

ඉතින් ඔහොම ඉන්න කොට තද සුළඟත් හමන්න පටන් ගත්තා. රතු දිමියාගේ කොළය කැරකුණා. එයා කොළය හයියෙන් අල්ලා ගෙන එල්ලිලා හිටියා. මී අඹ ගහත් ඒ පැත්තට මේ පැත්තට වැනුණා. රතු දිමියා හොඳට ම බය වුණා.

මහ වැස්සක් එන්න වගෙ... අනිත් දිමියෝ ඉක්මනට එයාලගේ දිමි ගොටුවට රිංගුවා. ඒ දිමි ගොටුව නම් සුළඟට වැනුණෙ නෑ. හෙමින් හෙමින් වැස්ස පටන් ගත්තා.

"රතු දිමියෝ තෙමෙන්නේ නැතුව එන්න අපේ ගේ ඇතුළට." තවමත් කොළයක එල්ලිලා දඟලන රතු දිමියා දැකලා අනිත් අය කීවා.

"නෑ නෑ මට තනිව ම ඉන්න පුළුවන්" රතු දිමියා කීවා.

සුළඟත් වැස්සත් එන්න එන්න ම වැඩි වුණා. රතු දිමියා වැස්සේ තෙමි තෙමී ගොටුව හදන්න මහන්සි ගත්තා. ඒත් වැඩක් වුණේ නෑ. එතකොට ම ලොකු සුළඟක් හමන්න පටන් ගත්තා. රතු දිමියා එල්ලී සිටි කොළය සුළඟට කැරකුණා. ඒ එක්කම නටුවෙන් ගැළවිලා ඈතට විසි වුණා.

"ආහ්! අයියෝ..."

රතු දිමියා කෑ ගැසුවා.

ගොටුව ඇතුළේ හිටි නිසා රංචුවේ කාටවත් රතු දිමියා කෑ ගහන හඬ ඇසුණෙ නෑ. එයා කොළයත් එක්ක ඈතට විසි වෙලා වැටුණා. වැහි වතුර පාර එයාගේ

ඇඟ උඩින් ගියා. එයා වතුරේ ගිලුණා.

ටික වෙලාවකින් වැස්ස පැච්චා. දිමියෝ රංචුව ගොටුවෙන් එළියට ආවා.

"අනේ කෝ අපේ රතු දිමියා?"

එයාලා වටපිට බැලුවා.

"අනේ අපේ රතු දිමියා නෑ. අපේ රතු දිමියාට මොකද වුණේ?" හැමෝම කලබල වුණා.

"අනේ හොයමු! හොයමු! රතු දිමියාට මොකද වුණේ කියලා හොයමු" දිමියෝ රංචුව හැම තැන ම දුව පනිමින් එකා වගේ රතු දිමියා ව සෙව්වා.

"රතු දිමියෝ! රතු දිමියෝ!"

"ම්හ් සද්දයක් වත් නෑ. අනේ අපේ රතු දිමියාට කරදරයක් වෙලා වත් ද?"

දිමි රංචුව හැම තැන ම රතු දිමියා ව සෙව්වා.

"රතු දිමියෝ! රතු දිමියෝ!"

"ආ අර රතු දිමියා." කොළ රොඩු ගොඩක් අතරේ හිරවෙලා හිටි රතු දිමියා ව එයාලා දැක්කා. දිමියො රංචුව දුවලා ගිහින් රතු දිමියා ව රොඩු ගොඩෙන් එළියට ඇදලා ගත්තා.

ඊට පස්සේ එයාලා ගොටුව ඇතුළට අරගෙන ගියා. අනේ වතුර පෙව්ලා රතු දිමියාට හොඳට ම අමාරුයි. ඇස් දෙකත් පියවිලා. මූණත් සුදුමැලි වෙලා කතා කරගන්නත් බෑ.

දිමියෝ රංචුව එකතු වෙලා රතු දිමියාට සාත්තු කළා. රතු දිමියා ටිකෙන් ටික ඇස් ඇරියා.

"අනේ මං මේ කොහෙද ඉන්නේ?" රතු දිමියා ඇසුවා.

"වැස්සට තෙමිලා, සුළඟට විසිවෙලා, ගිහින් කුණුරොඩු ගොඩක හිරවෙලා ඉන්න කොට අපි ඔයාව අරගෙන ආවා." දිමි රංචුව කීවා.

රතු දිමියාට හොඳට ම ලැජ්ජා හිතුණා. එයා ලැජ්ජාවෙන් බිම බලා ගත්තා.

"රතු දිමියෝ ඔයා අපි එක්ක එකතු වෙලා සමගියෙන් හිටියා නම් ඔහොම වෙන්නේ නැහැනෙ. අපි හැමෝම සමගි වුණා ම තමයි අපේ බලය වැඩි වෙන්නේ."

දිමි රංචුව රතු දිමියාට කීවා.

"ඔව්, ඔව් මට තේරුණා. මට සමාවෙන්න මම මීට පස්සේ ඔයාල එක්ක

සමගියෙන් ඉන්නවා. මට තනි දිමි ගොටුවක් ඕනෙ නෑ. අපි ඔක්කොම එකතු වෙලා ඉඳිමු.''

රතු දිමියා කීවා. හැමෝම රතු දිමියා එක්ක තිබුණු අමනාපකම් අමතක කරලා එයා ව ආදරයෙන් පිළිගත්තා.

ඊට පස්සේ රතු දිමියා සමගියෙන් සන්තෝසෙන් දිමි ගොටුවේ හිටියා.

## කතුවරිය හඳුනා ගනිමු

### ජානකී සූරියආරච්චි



| | |
|---|---|
| ගම | - පුහුල්වැල්ල |
| පාසල | - විශාඛා විද්‍යාලය, කොළඹ |
| උසස් අධ්‍යාපනය | - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධිය සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය |
| ළමා කතා කිහිපයක් | - කැවුම් හොරා, අච්චාරු හෝටලේ, නැට්ටුක්කාරි, අඬන බබා, බුහුකි |

### ක්‍රියාකාරකම 4.1

පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

1. 'රතු දිමියා' ළමා කතාවේ කතුවරිය කවුද?
2. එම කතුවරියගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරන්න.

### ක්‍රියාකාරකම 4.2

1. මෙම කතාවෙන් කියවෙන්නේ කුමක් ගැන ද?
2. පහත වචනවල අර්ථය සරල බසින් සඳහන් කරන්න.
   - i. සුදුමැලි වෙලා -     ii. අඹ වාරය -
   - iii සාත්තු කළා -     iv. රැළ -

### ක්‍රියාකාරකම 4.3

1. පහත දැක්වෙන ප්‍රකාශ කිව්වේ කවුද? කාට ද?
   - i. ''ඔයාගේ දිමි ගොටුව හදන්න අපිත් උදවු කරන්න ද?''
   - ii. ''අනේ මං මේ කොහෙද ඉන්නේ?''

iii. ''ඔයා අපි එක්ක එකතු වෙලා සමගියෙන් හිටියා නම් ඔහොම වෙන්නේ නැහැනෙ.''

iv. ''නෑ නෑ මට තනිව ම ඉන්න පුළුවන්''

2. කතාව කියවා පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ............ ii. ............ රංචු පිටින් අඹ ගහ දිහාට ඇදෙනවා.

iii. ............ iv. ............ කීචි බීචි කියමින් මී අඹවල රස බලනවා.

## ක්‍රියාකාරකම 4.4

1. රතු දිමියා අනිත් අයට ඇහුම්කන් නොදුන්නේ ඇයි?
2. රතු දිමියාට සිදු වූ කරදරය කුමක් ද?
3. රතු දිමියා සොයා ගත්තේ කුමන ස්ථානයක සිර වී සිටිය දී ද?

## ක්‍රියාකාරකම 4.5

★ පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.

★ පහත ප්‍රශ්නවල පිළිතුරු කණ්ඩායමේ මිතුරු/මිතුරියන් සමග සාකච්ඡා කරන්න.

1. මෙම කතාවේ වඩාත් ඔබේ සිත් ගත් අවස්ථාව කුමක් ද?
2. රතු දිමියා කතාව රසවත් වීමට හේතු දෙකක් උදාහරණ සහිත ව ඉදිරිපත් කරමින් කතාවෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ පැහැදිලි කරන්න.
3. සාකච්ඡා කළ තොරතුරු නිර්මාණශීලී ව පන්තියට ඉදිරිපත් කරන්න.
4. ඉදිරිපත් කිරීම සඳහා විවිධ මාධ්‍ය යොදා ගන්න.

ඔබේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.

ඔබගේ හැකියාවට අනුව අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න.

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| මෙම ළමා කතාවේ කතුවරිය හා ඇයගේ වෙනත් නිර්මාණ දෙකක් කියන්න මට පුළුවන්. | | | |
| මෙම කතාව කියවා අවබෝධ කර ගෙන අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න මට පුළුවන්. | | | |
| රතු දිමියා කතාව රසවත් වීමට හේතු සහ ලබා ගත හැකි ජීවිතාදර්ශ කියන්න මට පුළුවන්. | | | |



කාලච්ඡේද 02යි.

# ළමා කතා නිර්මාණය කරමු

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;
- ⋆ කතන්දර නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- ⋆ කතන්දර නිර්මාණය කිරීමට සුදුසු සිදුවීම්/අවස්ථා හඳුනා ගැනීමටත්
- ⋆ රසවත් කතන්දර නිර්මාණය කිරීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

## ක්‍රියාකාරකම 5.1

1. 'රතු දිමියා' ළමා කතාවේ අවසානය වෙනස් කර නැවත ලියන්න.
2. ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් පරිදි 'කතන්දර මාලය' ක්‍රියාකාරකමේ නිරත වන්න.

## ක්‍රියාකාරකම 5.2

1. පහත කතාව සම්පූර්ණ කරන්න.
2. ඔබ නිර්මාණය කළ කතාව පන්තියට ඉදිරිපත් කරන්න.

ඔන්න පුංචි යහළුවනේ එකමත් එක රටක ලස්සන පුංචි ගමක ඔයාල වගේ ම අපූරු යාළුවෝ ටිකක් හිටියා. මේ යාළුවෝ හරි ම එකමුතු යි. අනිත් අයට උදවු කරන්න හරි ම කැමති යි. දවසක් මේ යහළුවෝ පිරිස ගමනක් යන්න මගට ආවා. ඒ වෙලාවේ එයාලට අමුතු ශබ්දයක් ඇසුණා...

## ක්‍රියාකාරකම 5.3

1. පහත රූප ඇසුරින් කතාවක් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කරන්න.



(i)



(ii)



(iii)



(iv)



(v)

2. පහත රූප ඇසුරින් කතාවක් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කරන්න.



(i)



(ii)



(iii)



(iv)



(v)

## ක්‍රියාකාරකම 5.4

දැන් ඔබ තනි ව ළමා කතාවක් නිර්මාණය කිරීමට උත්සාහ කරන්න. ඔබ නිර්මාණය කළ කතාව බිත්ති පුවත්පතට යොමු කරන්න.

ළමා කතා නිර්මාණයේ දී මේ කරුණු ගැන සැලකිලිමත් වන්න.

- ළමා කතන්දරයක් නිර්මාණය කිරීමේ දී ඔබේ සිත් ගත් අවස්ථාවක්/අද්දැකීමක්/ඔබ දුටු සිහිනයක් තෝරා ගන්න.
- ළමා කතන්දරයකට සුදුසු චරිත තෝරා ගන්න.
- කතන්දරයේ සිදුවීම් පෙළගස්වා ගන්න.
- ළමා කතන්දරයකට සුදුසු භාෂාව භාවිත කරන්න.
- ඔබ තෝරා ගත් අද්දැකීම අනුව කතන්දරයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු සැකිල්ලක් සකස් කරන්න.
- එම සැකිල්ලට අනුව කතාව නිර්මාණය කරන්න.
- ඔබේ කතාවට ගැළපෙන චිත්‍ර ඇඳ හෝ අලවා පිටුවෙන් පිටුව සකස් කරන්න.
- ඔබ නිර්මාණය කළ කතාව යොදා ගෙන කතන්දර පොතක් නිර්මාණය කරන්න.
- පිටකවරයක් ද නිර්මාණය කරන්න.
- නිර්මාණය කරන ලද කතන්දරය පන්තියට ඉදිරිපත් කරන්න.
- ඔබ නිර්මාණය කළ කතන්දරය ගැන මිතුරන්ගේ/මිතුරියන්ගේ අදහස් විමසන්න.

## සාහිත්‍යයෙන් ජීවිතයට අත්වැලක්

- ඔබ රස විඳි සාහිත්‍ය නිර්මාණ ඇසුරින් ලබා දී ඇති පහත ක්‍රියාකාරකම්වල නිරත වීමට සූදානම් වන්න.

## ක්‍රියාකාරකම 5.5

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.
- ඔබගේ කණ්ඩායමට ලැබෙන පහත පැවරුමෙහි ප්‍රශ්නයට/ප්‍රශ්නවලට පිළිතුරු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- ඔබ සාකච්ඡා කළ කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- විවිධ මාධ්‍ය යොදා ගනිමින් නිර්මාණශීලී ඉදිරිපත් කිරීමක් සිදු කරන්න.
- අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කරන කරුණුවලට හොඳින් සවන් දී වැදගත් කරුණු මතකයේ රඳවා ගන්න.
- අනෙක් කණ්ඩායම් විසින් සිදු කරන ලද නිර්මාණශීලී ඉදිරිපත් කිරීම් අගය කරමින් අදහස් දක්වන්න.

### පැවරුම

1. මිතුරකු/මිතුරියක ලෙස තංගමනීගේ සිතේ ඇති වූ වේදනාව නැති කිරීමට ඔබට කළ හැක්කේ මොනවා ද?
2. 'පිච්ච කැකුළු' ගීතයෙන් ඔබේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?
3. 'මිදුලේ වැලි මාලිගාවේ' ගීතයේ දුවගේ අධිෂ්ඨානය පෙන්නුම් කරන අවස්ථා මොනවා ද?

4. 'මල් බස්' කවි පන්තියේ විවිධ මල්වල ලක්ෂණ හා මිනිසුන්ගේ ගුණාංග සමාන කර ඇති ආකාරය විස්තර කරන්න.
5. 'මල් බස්' කවි පන්තියෙන් අපගේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?
6. 'රතු දිමියා' කතාවෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?
7. ඔබේ යහළුවා/යෙහෙළිය ඔබට කළ අමතක නොවන උදව්ව කුමක් ද?

## ක්‍රියාකාරකම 5.6

- ඉහත 1 සිට 7 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු අභ්‍යාස පොතේ සටහන් කරන්න.
- පිළිතුරු ලිවීමේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමේ දී සාකච්ඡා කළ තොරතුරුවලට අමතර ව ඔබේ අදහස් ද එකතු කරන්න.

## වැඩිදුර ඉගෙනුම සඳහා

පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදී පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නිරත වන්න.

- 'රතු දිමියා' ළමා කතාව නාට්‍ය පිටපතක් ලෙස සකස් කරන්න.
- ඔබ සකස් කළ නාට්‍ය පිටපත රඟ දැක්වීමට පුහුණු වන්න.
- ඔබ පුහුණු වූ නාට්‍යය පන්තිය ඉදිරියේ/සාහිත්‍ය සමිතියේ රඟ දක්වන්න.

## උගත් දේ සිහි කරමු

- කවි හා ගීත නිර්මාණවල පසුබිම් තොරතුරු හඳුනා ගැනීමටත්
- කවි හා ගීත නිර්මාණවල අර්ථය හඳුනා ගෙන ප්‍රකාශ කිරීමටත්
- කවි සහ ගීත රස වින්දනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- කවි හා ගීත නිර්මාණ රස වින්දනයේ හා විචාරයේ යෙදීමටත්
- කවි හා ගීත නිර්මාණය කිරීමටත්
- ළමා කතන්දරයේ පසුබිම් තොරතුරු හඳුනා ගැනීමටත්
- ළමා කතන්දරයේ අර්ථය හඳුනා ගෙන ප්‍රකාශ කිරීමටත්
- ළමා කතන්දර රස වින්දනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- ළමා කතන්දර රස වින්දනයේ හා විචාරයේ යෙදීමටත්
- ළමා කතන්දර නිර්මාණය කිරීමටත්

ඔබට හැකියාව ලැබෙන්නට ඇත.